# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1814/53 - 2013 ජුනි මස 12 වැනි බදාදා - 2013.06.12

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමයන්

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කොටස්, මැදවල නගර සංවර්ධන කටයුතු යටතේ මැදවල ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා වහා අවශ්‍යව ඇති බව මගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජුනි මස 06 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

*උපලේඛනය*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල සීමාව තුළ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 484, මැදවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මැදවල ගමේ පිහිටි, ලියාපදිංචි බලයලත් මිනින්දෝරු ඩී. එම්. ඒ. සී. දිසානායක මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 1222 හා 2011.07.09 දිනැති පිඹුරේ කැබලි අංක 1, 2 හා 3 ලෙස නිරූපිත හෙක්. 0.51021 කින් යුක්ත ගෙදර කුඹුර නොහොත් වගලේ කුඹුර, අටලහේ කුඹුර සහ නාගහමුල අංගේ කුඹුර නැමැති ඉඩම් කැබලි 03ට මායිම්.

| | | |
|---|---|---|
| *කැබලි අංක* | : | 01 |
| *ප්‍රමාණය* | : | හෙක්. 0.23063 ; |
| *උතුරට* | : | ඇළ ඉවුර ; |
| *නැගෙනහිරට* | : | ඇළ ඉවුර සහ පිඹුරු අංක 1222හි කැබලි අංක 2 ; |
| *දකුණට* | : | ඇළ ඉවුර සහ අනිල් වීරසේකර සහ තවත් අය හිමිකම් කියන හිටිනා ගෙදර වත්ත ; |
| *බටහිරට* | : | එම්. ජී. තිලකරත්න හිමිකම් කියන තලගහපැලේ කුඹුර. |


1A - G 017791 — 340 (2013/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | | |
|---|---|---|
| *කැබලි අංක* | : | 02 |
| *ප්‍රමාණය* | : | හෙක්. 0.18110 ; |
| *උතුරට* | : | ඇළ ඉවුර ; |
| *නැගෙනහිරට* | : | ඇළ ඉවුර ; |
| *දකුණට* | : | ඇළ ඉවුර, චම්පා ධර්මවර්ධන සහ තවත් අය හිමිකම් කියන මැදවල පිටියේ හේන ; |
| *බටහිරට* | : | ඇළ ඉවුර, මෙම සැලැස්මේ කැබලි අංක 01 සහ අනිල් වීරසේකර හිමිකම් කියන හිටිනා ගෙදර වත්ත. |

| | | |
|---|---|---|
| *කැබලි අංක* | : | 03 |
| *ප්‍රමාණය* | : | හෙක්. 0.09848 ; |
| *උතුරට* | : | ඇළ ඉවුර සහ මෙම සැලැස්මේ කැබලි අංක 02 ; |
| *නැගෙනහිරට* | : | ඇළ ඉවුර සහ එච්. එම්. අබේසිංහ මහතා හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | චම්පා ධර්මවර්ධන, මහින්ද වීරසිංහ සහ තවත් අය හිමිකම් කියන මැදවල පිටියේ හේන, ඇළ ඉවුර, සහ උදේනි සමරනායක හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 02. |

06 - 741

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.